

# අසෙනිය කුසුම

නිරාෂ ගුණසේකර



**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තෝරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## නොනිම් ඇඳුම

සාලේ පුටුව මත
කුසට අත තියාගෙන
නංගී මසයි ඇඳුමකට
ඉගිළෙන කුරුලු යුවළක්
පැටලුණු නූල් බෝලයකින්...

අම්මා ඇවිත් මිදුලට
තෙල් දමයි බුදු ගෙයි පානට
බලයි නංගී දෙස හොරෙන්
ගිනිකූර ළං කරයි පානට...

පිලිස්සුණු හේන පාගා
අළු පිරි දෙපා ගසමින්
තාත්තා එනු පෙනෙයි
සැඳෑ කළුවර අතරින්...

අඩක් නිම් ඇඳුම
තබා පසෙකින්
නූල් බෝලය ගෙන'තට
පැටලුම් හරින්නට තනයි නංගී
කුස දෙස බලාගෙන...

ඇඳුමේ සැඳෑ අහසෙහි
පා ව යන වලාකුළු මැද
ඉගිල්ලෙන්නට වෙර දරයි
තටු නොනිම් කුරුලු ජෝඩුව...

**නඳුන් යසිත දසනායක**

('සියුම් අත්තටු නාද' කාව්‍ය සංග්‍රහය - 2012 )

ඝෝෂාකාරී බවින් තොරව සරල සැහැල්ලුම වචනවලින් හදවතේ පතුලටම දැනෙන කවි ලියන අතළොස්සක් නවක කවියන් අතර නඳුන් යසිතට හිමි වන්නේ සුවිශේෂී තැනකි. කවිය මගහැරී වචන විතරක් පෙනෙන මෝස්තරාත්මක සාටෝප බසක් වෙනුවට ඔහු සෑම විටම තෝරාගන්නේ දෛනික ව්‍යවහාර බසකි. ඒ නමුදු ඊයම් බරු සේ හිත ඇතුළට කිඳා බසින ඒ නිර්මාණවල ඇත්තේ වචනයට එහා ගිය අනුභූතිය එහෙම නැත්නම් නිර්මාණය හෝ ප්‍රකාශනය විසින්ම සම්පාදනය කරන අර්ථමය ගැඹුරකි. අද බිහිවන බොහෝ කවිවල මේ ලක්ෂණය දැකගන්න නොලැබෙන අතර වචනය මතම රැඳෙමින්, රඳා පවතිමින් වදන් තොරණ් නිමවන බොහෝ ලියන්නන්ට නඳුන් වැනි හෙමීට සීරුවට පාඩුවේ ලියන කවියෙකුගෙන් ඉගෙන ගත යුතු දෑ බොහෝ යැයි සිතමි.

'නොනිම් ඇඳුම' නම් හිසින් සිව් වසකට පමණ ඉහත ලියැවුණු මේ කවියත් ඔහුගේ බොහෝ කවි වාගේම සරල ආකෘතියක බහාලූවද එමගින් ගැඹුරු වින්දන පථයක් අපට ලබා දේ. කවියක් ඇතුළේ රූපකාර්ථවත් බස එනම් චිත්තරූප ක්‍රියා කරන්නේ කෙසේ දැයි යන්න මනාව කියාපාන නිමැවුමකි මේ. ඇත්තටම මේ කවිය ලියාගත යුත්තේ අප විසිනි. ඔහු ඊට මනා ඉඩ ප්‍රස්ථාවක් තනා දීමට පුංචි පුංචි චිත්තරූප පෙළක් පමණක් භාවිතා කරයි. මේ වාග්රූප හෝ චිත්තරූප භාවිතය පවා අද දවසේ කවිය තුළ අවභාවිතාවට ලක්වී ඇතැයි මට සිතේ. නිකන්ම එල්ලපු රූප රාමු පෙළක් කවියක චිත්තරූප නොතනයි. ඒවා නිකන්ම නිකන් රූප රාමු විනා කවිය කියවන්නාට ඔහුගේම වූ වෙනත් කවියක් කියවගන්නට ඉඩ හසර නොතනයි. නමුත් සාර්ථකව චිත්තරූප භාවිතා කර ඇති කවියක දී කියවන්නා, ලියන්නා විසින් පෙන්වූ ඇවිළවූ දෑ තුළ කවිය ලියා ඇති වචනවලට එහා ගිය යමක් කියවගන්නට සමත් වේ. එනම් කවිය ලිහා ගන්නට සමත් වේ. මේ කවිය තුළද අප කවියා චිත්තරූප පෙළක් එකින් එක දිගහරී. කුඩා චිත්‍රපටයක් වන් ඒ රූප රාමු පෙළෙහි සැඟවී ගිය කතාව අප විසින් සොයා පාදා ගත යුතුය.

කවිය ඇරඹෙන්නේ නිවසක සාලයක පුටුවකට වී ඇඳුමකට කුරුලු යුවලක් මසන සහෝදරියකගේ රූපයක් මවමිනි. මෙය බැලූ බැල්මට ඉතා සරල සිද්ධියක් සේ පෙනුණද පළවෙනි කොටසේම අන්තිම පදයෙන් ඔහු මේ වෙනුවෙන් වෙනම බරක් තබන්නට සමත් වේ. එනම් ඈ ඒ මැස්ම මසන්නේ පැටලුණු නූල් බෝලයකින් යැයි පවසමිනි. තරුණ ගැහැණු ළමයකු ඇඳුමකට කුරුලු ජෝඩු මසන්නේ මොන වගේ අවස්ථාවන්වල දැයි අපි දනිමු. ඒ බොහෝ විට විවාහය, මධුසමය අබිමුවේ දීය; ඒ, ඒ වෙනුවෙන් පෙර සූදානමක් ලෙසිනි. නමුත් යථෝක්ත සහෝදරිය ඈ උදරයට අත තියාගෙන මේ කුරුලු ජෝඩුව මසන බව පැවසීමෙන් අපට වහා වැටහී යන්නේ ඒ මසන්නේ ඇගේ ඇඳුමකට නොව, ඈ කුසේ ඉන්නා කුඩා දරුවෙකු වෙනුවෙන් බවය. එය ඉතාමත් සුබ සිහිනයක් වාගේ පෙනුණද පැටලුණු නූල් බෝලයක් මේ මැද්දට දමා ගසා නඳුන් තීව්‍ර කරන්නේ ඇගේ ජීවිතයම නූල් බෝලයක් සේ පැටලී එහි ප්‍රතිඵලයක් ඈ විසින් අත්විඳින බවක් නොවේද? මහගෙදරක සාලය මැද්දට කැමරාව අල්ලා නඳුන් මේ පෙන්වන්නේ අන්ත අසරණ වූ තනිවූ සහෝදරියකගේ එනම් ගහැණියකගේ කතා පුවතකි. නමුදු ඈ දිරිමත්ය. ඈ හෙට දිනයේ උපදින්න නියමිත දරු පැටියා වෙනුවෙන් නොහඬමින් ඈ ශක්ති ප්‍රමාණයෙන් ලක ලැහැස්ති වන්නීය. එය ඈ වෙනුවෙන් අනුකම්පාවක් දනවනවාට වඩා සතුටක් මා සිත නංවන්නේ ඇගේ ඒ බලාපොරොත්තු සහගත බව නිසාවෙනි.



අනතුරුව කැමරාව හැරෙන්නේ අම්මා දෙසටය. ඈ මිදුලේය. බුදු ගෙයි බුදු පහනට ඈ විසින් තෙල් වත් කෙරෙයි. අනතුරුව පහන දල්වන්න ගිනිකූරක් ගසා ළං කරයි. මේ ඇගේ දෛනික චර්යාවන්ගෙන් එකකි. ඉදින් මෙහි විශේෂයක් තියේ දැයි යන්න දැන ගැනීමට ඒ රූප රාමු දෙස සියුම්ව බලා සිටිය යුතුය. අම්මාට වෙනදා වාගේ නිස්කාංසුවේ බුදුන් වැඳ ගැනීමට බැරි සෙයකි. ඇගේ හිත මත තම දියණියගේ පැටලුණු ජීවිතය කඩා වැටී ඇත. දරුවකුට දුකක් කරදරයක් වූ තැන දෙමාපියන්ට ඉන් පළා යා නොහැක. ඈ තම දියණිය වෙනුවෙන් මේ දුක ඉවසා දරා උන්නද, ඇගේ හිතේ තම දියණිය වෙනුවෙන් ඇති අනුකම්පාව බිඳකුදු අඩු නොවේ. බුදු පහන දල්වද්දී පවා හෙ-ාරාටම ඈට බැලෙන්නේ සාලයේ තනිවම බිළිඳු ඇඳුම් මසන ඈ ය. ඇගේ සිත එක අරමුණක නැත. හිත එකළස් කරගෙන තියන බුදු පහන පවා අද තියන්නේ හිත මහා බරකින් බරකරගෙනය. මේ කැමරාව නොපෙන්වූ තව බොහෝ දේවල් තියෙන්නට පුළුවන. ඈ රෙදි පොටින් ඈ ඇස් තනිවම පිසගන්නට ඇත; බුදුන්ගෙන් පිහිටක් පතන්නට ඇත; මගේ දරුවාටම මේ දේ වුණේ ඇයි දැයි සිතමින් සාම්ප්‍රදායික අම්මා කෙනෙකු වාගේම හිතෙන් ළතැවෙන්නට ඇත. ඉදිරියට කළ යුතු දෑ ගැන සිතා බලන්නට ඇත. නමුත් මෙකී නොකී සියල්ල අපට සිතා ගන්නට හැර කැමරාකරුවා කැමරාව වෙනත් තැනකට හරවන්නේ මේ සංදර්භය වෙනත් අතකට යොමු කිරීමටය.

දැන් කැමරාව තාත්තා දෙසටය. හැන්දෑවේ බුදු පහන තැබූ අම්මාගෙන් මෑත්ව සැඳ කළුවර අතරින් තාත්තා එනු පෙනේ. හේ එන්නේ නිකන් නොවේ. පිළිස්සුණු හේන පාගා අළු පිරි දෙපා ගසමිනි. තාත්තලා නම් එහෙමය. දරුවන්ට දුකක් කරදරයක් වූ තැන අම්මලා මෙන් විස්සෝප වන්නට හඬා වැළපෙන්නට ඔවුනට බැරිය. ඔවුහු ඇතුළෙන් හඬා වැළපෙත්. ඒවා සියුම් ඉසියුම් කෙඳිරිලි විනා පිටතට නොපෙනෙන නොපෙන්වන දෝමනස්සයෝ වෙත්. තාත්තා යනු ගෙදරක ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ මූල්‍යමය නිශ්පාදනය වෙනුවෙන් මූලිකවම මහන්සිවන චරිතය වේ. මේ කියන ගැමි පරිසරයට අනුව ගත්තත්, මේ තාත්තාත් එන්නේ ඔවුනගේ හේන පාගා අලුත් වගාවකට මුලපුරන්න මූලික දෑ සකස් කිරීමෙන් අනතුරුවය. දරුවන් උස් මහත් වී දීග යන කල වයසට ආවත්, බොහෝ තාත්තලාට තම ජීවිතයේ සැඳෑ සමය එළැඹෙන තුරුත් දරුවන් වෙනුවෙන් රැකියා කරන්න වේ. නමුත්, මේ තුළ අපට දැක ගත හැකිවන්නේ දුකක් කරදරයක් වූ තැන වැළපෙමින් නොඉඳ හෙට වෙනුවෙන් තමාගේ යුතුකම් පැහැර නොහැර ඒ කරදරයන් වඩාත් හොඳින් හෙට දවසේ නිරවුල් කරගන්න ශක්තිසම්පන්නව ඇප කැප වන තාත්තා කෙනෙකි. වෙනදා මෙන් නොව, ඔවුන් ආර්ථිකව හා වෙනත් සමාජමය කාරණා හමුවේත් වෙනදාට වඩා දැන් ශක්තිමත් වියයුතුය. පිටස්තරයන්ගෙන් එල්ල වීමට නියමිත අපවාද අවලාද ඈ ආදියටත් දැන් ඉතින් සූදානම් විය යුතුය. ඉදින් මේ සියල්ලටම නොබියව ජීවිතය ජයගත හැකි ශක්තියකින් සිටීමට තාත්තාගේ මැදිහත් වීම ඉතාමත් ප්‍රබල සාධකයක් වන අතර, තමාගේ එදිනෙදා වැඩ කටයුතු මේ අකල් කරදරය නිසා පාඩු කරගන්නේ නැතුව හේන් කොටා පාගා හෙට දවස වෙනුවෙන් ලක ලෑස්ති වීම තුළ ඒ ක්‍රය ශක්තිය වඩාත් තීව්‍ර වී පෙනේ.

අප කැමරා ශිල්පියා නැවතත් කැමරාව කතා නායිකාව දෙසට යොමු කරයි. ඈ ඒ වන විට ළදරු ඇඳුමේ අඩක් නිමවා ඇත. සැඳ කළුවර ගලන තුරු කාලය ගෙවී තිබුණත් යන්තම් නිමවී තිබුණේ ඇඳුමේ අඩක් පමණි. ඈ මේ නිම් කරමින් සිටින්නේ හෙට අනිද්දාට එන්න නියමිත දරු පැටික්කෙකුගේ ඇඳුමකි. නමුත් ඒ බිළිඳාට තමා හැර තාත්තා කෙනෙකු නැති බවක් මේ කවියේ මුල සිටම හැඟෙන්නට දී ඇත්තේ ඇගේ තනිකමද පසෙකින් ඉස්මතු කරමිනි. ඉතින් එවන් වූ ලෝකයකට එළිය ලබන්නට හදන දරු පැටවකු වෙනුවෙන් නිමවන ඇඳුමක් සන්තෝසයෙන්, මහත් වූ බලාපොරොත්තු සහිත බවකින් කළ හැක්කක් නොවේ. ඈ එය කරන්නම ඕන කමට කරනවා මිසෙක

46 පිටට